# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,097 — 1920ක්වූ අප්‍රේල් මස 9වෙනි දිනවූ සිකුරාදා.


# Part IV. — හතරවෙනි කාණ්ඩය.

## උපාධිගනිති.

වර්ෂ 1914වේ අංක 29යේ ආඥාපනතේ 4වෙනි වගන්තියෙන් අමුතුකරනලද 1898වේ අංක 13ගේ ආඥාපනතේ 56 (20A) දරණ වගන්තිය යටතේ මිනුවන්ගොඩ ලෝකල් බෝර්ඩ් සභාව විසින් සාදනලද්දාවූ කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව වැඩබලන ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් ස්ථිරකරනලද මෙහි පහත දක්වන අතුරු පනත් මහජනයාගේ දැනගැන්ම පිණිස මෙයින් ප්‍රසිද්ධකරන්ට යෙදුනා ඇත.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1920ක්වූ මාර්තු මස 31වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ, වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

### වැසිකිළි සුද්ධකිරීම හා මහාජනයාගේ සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධ අතුරුපනත්.

1. ප්‍රථමකොට සභාපතිතැනගෙන් ලියවිල්ලක් පිට ලබනලද අවසරයක් නොමැතිව ඉඩම් හිමියෙකුට හෝ පදිංචිකාරයෙකුට ඔහුගේ ඉඩමේ හෝ ගේ අවට ප්‍රදේශයෙහි කිසිම විධියේ වැසිකිළියක් තැනීම හෝ තනවන්ට සැලැස්වීම නුපුළුවන.

2. (a) පළමුවෙනි උප නීතියේ ප්‍රකාර එවැනි අවසරයක් ලබාගැණීම පිණිස ඉල්ලුම්පත්‍රයක් යැවූ කල්හි සභාව විසින් පිළිගන්නාලද යම් විශෙෂ ක්‍රමයේ වැසිකිළියක් මිස අන්‍ය ක්‍රමයේ වැසිකිළියක් නොතැනීමට බලකිරීමට සභාපතිතැනට හෝ සභාවට බලය තිබේ.

(b) තවද සභාපතිතැන හෝ සභාව එවැනි වැසිකිළියක් සෑදීමට සුදුසු ස්ථානයක් නියමකරනවා ඇත. තවද කිසිම වැසිකිළියක් අන්‍ය ස්ථානයක තැනීමට අවසරදීම ප්‍රතික්ෂෙපකරනවා ඇත.

(c) සනීපාරක්ෂක ක්‍රමයන් අනුව එවැනි ඉදිකිරීමකට අවසර නොදීම සෑහේයයි සභාපතිතැනට හෝ සභාවට කල්පනා වන්නේ නම් යම්කිසි ඉඩමක යම්කිසි වැසිකිළියක් තැනීමට අවසරය දීම සහමුලින්ම ප්‍රතික්ෂෙපකිරීමට සභාපතිතැනට හෝ සභාවට වැඩිදුරටත් බලය තිබේ.

3. (a) අවසර නොමැතිව හෝ සභාපතිතැන විසින් හෝ සභාව විසින් නිකුත්කරණලද යම් අවසරපත්‍රයක ඇති වගන්තිවලට විරුද්ධව හෝ සාදනලද වැසිකිළියක් පිහිටා තිබෙන යම් ඉඩමක හිමිකාරයාට හෝ පදිංචිකාරයාට එම වැසිකිළිය සභාපතිතැන විසින් හෝ සභාව විසින් නියමකරණුලබන සෑහෙන කාලයක් තුළදී බිඳහෙලා වසාදැමීමට ලියවිල්ලකින් අණකිරීමට සභාවට හෝ සභාපතිතැනට බලය තිබේ.

(b)—(a) යන උප වගන්තියේ ප්‍රකාර කරනලද අණක් ඉෂ්ටකිරීම කඩකරන්නාවූ යම් කෙනෙක් ඇද්ද ඔහු වරදක් කළාවේ.

4. (a) සභාවෙන් නියමකරන ආකාර එවැනි ක්‍රමයේ හෝ ප්‍රමාණයේ වැසිකිළියක් අසවල් ස්ථානයෙහි ඊට සම්බන්ධවූ කරුණුත් ඇතිව අණකළවේ නියමකරන කාලයක් තුළදී ඉදිකිරීම පිණිස ඉඩම් හිමියාට හෝ පදිංචිකාරයාට සභාව විසින් අණකරණු ලැබේ.

(b)—(a) යන උප වගන්තියේ ප්‍රකාර කරනලද අණක් ඉෂ්ටකිරීම පැහැරඅරින්නාවූ යම් කෙණෙක් ඇද්ද ඔහු වරදක් කළාවේ.

5. (a) යම් වැසිකිළියක් පිහිටා තිබෙන්නාවූ ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට එවැනි වැසිකිළිය සභාවෙන් නියම්වන කාලයක් තුළදී සහ එම ප්‍රකාරයටත් අළුත්වැඩියාකිරීමට හෝ වෙනස්කිරීමට හෝ නැවත තැනීමටද නැතහොත් නියමකරණලද කාලයක් තුළදී බිඳහෙලා වසාදැම්මටද ලියවිල්ලකින් අණකරන්ට සභාවට පුළුවන. එසේ කරන්නේ සභාවේ කල්පනාවේ හැටියට එවැනි වැසිකිළියක් ඉදිකිරීම් ශාස්ත්‍රයේ හැටියට වරද සහිතනම් එක්කෝ එය පාවිච්චිකරන කාරණාව අයොග්‍යනම් එක්කෝ එයින් අසනීපයක් හටගන්න පුළුවන්නම් එක්කෝ 8වෙනි උප නීතියේ ප්‍රකාර හෝ වෙන විධියකින් සභාව විසින් තනනලද සනීපාරක්ෂක අතු පාරක (මුඩුක්කු) නිසියාකාර පිහිටා නොමැත්තේද, එය පහසු ලෙස ශුද්ධකිරීමට නොහැක්කේද එම වැසිකිළිය පිහිටා තිබෙන්නාවූ ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට සභාවෙන් නියම වන්නාවූ ආකාරයට සහ නිසි කාලයක් තුළදී එම වැසිකිළිය අළුත්වැඩියාකිරීමට හෝ වෙනස් කිරීමට හෝ නැවත සෑදීමට හෝ කඩා වසාදැම්මට ලියවිල්ලකින් අණකිරීමට සභාවට පුළුවන.

5. (b)—(a) යන උප වගන්තියේ ප්‍රකාර කරනලද අණක් ඉෂ්ටකිරීම පැහැරඅරින්නාවූ යමෙක් ඇද්ද ඔහු වරදක් කළාවේ.

වචනවල තේරුම.

6. පහත දක්වන උප නීතිවල අදහස් පිණිස :—

"වැසිකිළිය" යන්නෙන් වියලි පස් දමන්ට බාල්දි තබා සාදන ක්‍රමයේ වැසිකිළි ඇතුළත්වේ.

"විශෙෂයෙන් නියමකරණලද භූමිභාගය" යන්නෙන් කලින්කලට සභාව විසින් විශෙෂයෙන් නියමකරණුලබන්නාවූද සභාවේ සීමාව තුළ පිහිටියාවූද එවැනි භූමි ප්‍රදෙශයක් හෝ ප්‍රදෙශ හඟවනවත්හැර ඇතුළත්වේ. එවැනි භූමි ප්‍රදෙශය සීමා තුළ පිහිටි සියලුම භූමිය හෝ එයින් කොටසක් හෝ කොටස් ඇතුළත් වේ.

7. විශෙෂයෙන් නියමකරණලද භූමිභාගයක හෝ විශෙෂයෙන් නියමකරණලද භූමිභාගයක කොටසක පිහිටියාවූ සියලුම වැසිකිළි බාල්දි තබා සාදන වියලි පස් දැමීමේ ක්‍රමය අනුව සෑදීමට නියමකිරීමටද සභා සම්මතය පිට පිළිවන්කම තිබේ.

8. වැසිකිළියක් හෝ වැසිකිළි පිහිටා තිබෙන ගෙයක හෝ ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට එම වැසිකිළිය හෝ වැසිකිළි වසාදමා ඒ වෙනුවට බාල්දි තබා සාදන වියලිපස් ක්‍රමයේ වැසිකිළියක් හෝ වැසිකිළි තැනීම පිණිස සභාව විසින් ස්ථිරකරණලද යෝජනාවක් පිට ලියවිල්ලකින් දැන්වීමක් කරනුලැබූකල්හි එවැනි දැන්වීම භාරදීමේදී සභාව විසින් නියමකරණුලබන කාලය තුළ එම දැන්වීමේ ප්‍රකාර ක්‍රියාකිරීම එම අයගේ හෝ අයවලුන්ගේ තද යුතුකමක් වේ. එවැනි දැන්වීමක තිබෙන කරුණු ඉෂ්ටකිරීම කඩකරන්නාවූ ඉඩම් හිමියා හෝ පදිංචිකාරයා අපරාධයක් කිරීමේ වරදකාරයෙක් වේ. තවද මේ නීතියේ ප්‍රකාර යම් වැසිකිළියක් තැනීම උවමනාකල්හි එය මොන වර්ගයේ එකක්ද එය පිහිටවන ස්ථානය කොතැනද යනාදිය ගැන උවමනා කාරණ කියාදීම සභාපතිතැනට හැකිවනසේ 1 (පළමු) වෙනි නීතියේ ප්‍රකාර සභාපතිතැනගෙන් අවසර ගැණීම උවමනාවේ.

9. යම් වැසිකිළියක් පිහිටා තිබෙන ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා එම වැසිකිළිය යහපත් අන්දමේ සහ ශුද්ධලෙසටද සනීපාරක්ෂක පිළිවෙළටද තැබීම සහ එයින් අසනීපයක් හටනොගන්නාලෙස බලාගැණීමත් ඔහුගේ යුතුකමක් වේ. එසේ කිරීම කඩකරන්නාවූ යම්කිසි ඉඩම් හිමියෙක් හෝ පදිංචිකාරයෙක් අපරාධයක් කිරීමේ වරදකාරයෙකු වන්නේය.

10. අසූචි ඉවත ගෙණයාම යහපත්සේ කෙරෙන පිණිස ඔවුන්ගේ ඉඩම් මැදින් හෝ පිටිපසින් අඩි 8කට වැඩි නොවන වැසිකිළි ශුද්ධකිරීමේ අතු පාරක් සභාපතිතැන කියන ආකාර ඔවුන්ගේම වියදමින් සෑදවීමට සහ එය පැවැත්වීමටත් විශෙෂයෙන් නියමකරනලද භූමිභාගයක පිහිටි ගෙවල් හෝ ගොඩනැගිලි හෝ ඉඩම් අයිතිකාරයාට හෝ එහි පදිංචිකාරයාට සභා සම්මතයෙන් කියා සිටීම නීති සහගතවේ.

11. යම් කිසි විශෙෂ භූමි භාගයක් ශුද්ධකිරීමේ කටයුතු සියල්ලම සභාව විසින් කරණු ලැබේ. තවද සභාපතිතැනගෙන් අවසරයක් නොමැතිව යම් කෙණෙකු විසින් හෝ ඔහු වෙනුවෙන් සිටිය කෙණෙකු විසින් හෝ ඔහුගේ මෙහෙකරුවෙකු විසින් එවැනි වැඩකිරීම නීතියට විරුද්ධවේ. එම භූමිභාගය තුළ එවැනි වැඩ සියල්ලම සභාව මගින්ම හොඳකාර කරවීම හැකියයි සභාපතිතැනට කල්පනාවේනම් එවැනි අවසරයක් දීම ප්‍රතික්ෂෙපකිරීමට සභාපතිතැනට බලය තිබේ.

12. අසූචි ඉවත්කිරීම පිණිස සභාව විසින් නියමකරනු ලබන්නාවූ ගාස්තු විශෙෂ භූමිභාගයක වැසිකිළි අයිතිකාරයන් හෝ පදිංචිකාරයන් විසින් මාස්පතා සභාවට ගෙවියයුතුයි. එවැනි ගාස්තු එම මෙහෙය කළාවූ මාසය ලඟ මාසයේ දහවෙනි දිනට ප්‍රථමයෙන් ගෙවිය යුතුයි.

13. දිනපතා කුලීකාරයින්ගේ මෙහෙය උවමනාකරණ ඇත්තන් විසින් ලියවිල්ලකින් සභාවෙන් ඉල්ලුම්කළ යුතුයි. තවද එම කුලීකාරයෝ සභාවෙන් ස්ථිරකරන ගෙවීමක් පිට සපයනු ලැබෙත්.

14. විශෙෂ භූමිභාගයකින් පිටත වාසයකරන්නාවූ අයෙක් ඔහුගේ වැසිකිළිය ශුද්ධකිරීම සභාවට භාරදීමට හෝ දිනපතා කුලීකාරයෙකුගෙන් වැඩ ගැනීමට කැමැත්තේනම් ඒ බව ලියවිල්ලකින් සභාපතිතැනට දැනුම්දිය යුතුයි. එවිට සභාව විසින් නියමකරන ප්‍රකාර රෙකුලාසි පිට එම කෘත්‍යය භාරගන්නවා ඇත.

15. අළුත් කුණු වළක් සෑදීම හෝ පවතින්නාවූ කුණු වළක් වෙනස්කිරීම හෝ අළුත්වැඩියාකිරීම හෝ නැවතත් සෑදීම හෝ වසාදැමීම උවමනායයි සභාව කල්පනාකළ විටක අළුත් කුණු වළක් සෑදීමට හෝ වෙනස්කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට හෝ නැවතත් සෑදීමට හෝ පවතින්නාවූ කුණු වළක් වසාදැමීමට යම්කිසි ඉඩම් අයිතිකාරයෙකුට හෝ පදිංචිකාරයෙකුට සභාපතිතැන විසින් අත්සන්කරනලද ලියවිල්ලකින් දැන්වීමක් කිරීමට සභාවට හැකිය. තවද එවැනි කුණු වළක් පිහිටන ස්ථානයද එහි මට්ටම සහ ප්‍රමාණයද එය සෑදීමට ගතයුතු උපකරණද වැඩේ කළයුතු අන්දම සහ එවැනි වැඩ සම්බන්ධවූ අනිකුත් විස්තර කාරණද ගැන කරුණු දන්වනවා ඇත. එවැනි දැන්වීමක් ලැබුනාට පසු සභාවෙන් නියමිත කාලය තුළදී සභාව විසින් උවමනාකරනලද කාරණ ඉෂ්ටකිරීම පැහැරහරින්නාවූ යම් ඉඩම් හිමියෙක් හෝ පදිංචිකාරයෙක් අපරාධයක් කිරීමේ වරදකාරයෙකු වෙනවා ඇත.

16. කුණුවතුර ගලාගොස් එක්කාසුවෙන වළක් ඇති යම් ඉඩමක අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට, එවැනි වතුර දිනපතා ඉවත්කිරීම සභාව විසින් කරණුලබන බව සභාපතිතැන විසින් දැනුම්දීම නීතිදායකවේ. එම කුණුවතුර ඉවත්කිරීම පිණිස සභාව විසින් නියමකරනුලබන යෝග්‍යවූ ගාස්තු ගෙවීමට ඉඩම් හිමියා හෝ පදිංචිකාරයා බැඳීසිටියි.

17. කුණු වතුර ගලාගොස් එක්වන්නාවූ යම් වළක් පිහිටි ඉඩමක අයිතිකාරයා හෝ පදිංචිකාරයා 16වෙනි නීතියේ ප්‍රකාර සභාපතිතැන විසින් දැනුම්දෙනු නොලැබුවේනම් එම ජලයෙන් බාධාවක් හටනොගන්න හැටියට සභාපතිතැන විසින් නියමකරනුලබන ස්ථානයකට එම ජලය ඉවත්කිරීම ගැන වගකිය යුතුයි. යම් ඉඩම් හිමියෙක් හෝ පදිංචිකාරයෙක් ඉහතකී ප්‍රකාර එවැනි කුණුවතුර ඉවත්කිරීම කඩකළොත් ඔහු අපරාධයක් කිරීමේ වරදකාරයෙකු වන්නේය.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

3,654, S. P.—හම්බන්තොට දිසාවේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ ඉඩම් විකිනීම් නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1920ක්වූ මැයි මස 24වෙනි දිනවූ සඳුදා උදේ 11ට හම්බන්තොට කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකන්රට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ හම්බන්තොට පලාතේ මාගම්පත්තු කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

මුල් සිතියම 11,256. ගම—දෙබරවැව. අයිතිකකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම | ඉල්ළුම්කාරයා. | අන්දම. | අක්කරයක මහත, අ. රූ. ප. | මිල, රු. |
|---|---|---|---|---|---|
| 8 .. | තිහවබැද්ද | .. වී. බී. කේ. අමත් සහ ඩබ්ලිව්. පී. අන්ද්‍රිස්හාමි | .. කැලේ | .. 26 0 7 | 75 |

මෙම ඉඩමට කිරිඳිඔයේ වම්ඉවුරේ ජලකම්ාන්තයෙන් වතුර ගන්ට පුළුවන. තවද අවුරුද්දට අක්කරයට රු. 4 බැගින් දියබද්දට යටත්ය. ආණ්ඩුවට ඕනෑවිටක දිය බදු මුදල වෙනස් කිරීමටද බලය තිබේ.

මෙම ඉඩම්වල වෙනත් තොරතුරු හම්බන්තොට ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේගෙන් සහ පිඹුරුකඩදාසි සම්බන්ධව සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගන්ට පුළුවන.

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 7වෙනි දින කොළඹ මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරීස් වම්හ.

**No. 2,095, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1920ක්වූ මැයි මස 26වෙනි දිනවූ බදාදා පස්වරු 1ට අනුරාධපුරේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කුවේ නුවරගම් පලාතේ පිහිටා තිබෙන බිම්කැබලි 31ක්.

සිතියම 422. ගම—කඩවත්කෝරලේ සන්ගිලිකනදරව. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේනම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 7I | සන්ගිලිකනදරවකැලේ | .. මදවච්චියේ පී. බී. ඩී. මහදිවුල්වැව සභාපතිතැන | අන්දඹුවාකැලේ | 9 | 0 | 15 | 40 |
| 1F | අන්දරකැලේ | .. — .. | .. හේන .. | 2 | 0 | 1 | 18 |
| | | සිතියම 659. ගම—විලච්චියකෝරලේ අඩම්පනේ. | | | | | |
| 14F | ආචාරියාගමලන්ද | .. වන්නිහාමි .. | .. හේන .. | 2 | 0 | 0 | 17 |
| 29 | අක්කරවෙලේ වැඩිබිම | .. — .. | .. අල්ලාගන තිබෙන පාලුකුඹුර | 0 | 1 | 29 | 20 |
| 50 | ලබුගම අක්කරේ වැඩිබිම | .. — .. | .. අල්ලාගන තිබෙන හේන්බිම .. | 0 | 0 | 14 | 20 |
| | | සිතියම 662. ගම—විලච්චියකෝරලේ රුලපනාව. | | | | | |
| 51G | ඇලපට්වැවලන්ද | .. ඩබ්ලිව්. එච්. බන්ඩා .. | .. හේන .. | 1 | 0 | 1 | 16 |
| 51I | එම | .. ඩබ්ලිව්. පිසිරිබන්ඩා .. | .. එම .. | 1 | 0 | 14 | 16 |
| 51J | එම | .. ආර්. බී. කේ. සුද්දහාමි .. | .. එම .. | 2 | 0 | 22 | 16 |
| | | සිතියම 665. ගම—විලච්චියකෝරලේ පහමුනේගම. | | | | | |
| 2N | පහමුනේගමකැලේ | .. පහමුනේගම අප්පුරාලගේ සුද්දහාමි .. | එම .. | 0 | 3 | 36 | 16 |
| 2O | නෙල්ලියගමකැලේ | .. එම .. | .. එම .. | 0 | 3 | 37 | 16 |
| | | සිතියම 694. ගම—විලච්චියකෝරලේ කරඹෑව. | | | | | |
| 9A | කෝන්ගහයායහේන | .. කරඹෑවේ රනාහේනයාගේ මැනිකා .. | එම .. | 1 | 3 | 31 | 16 |
| 9B | එම | .. කරඹෑවේ රනාහේනයාගේ උක්කුවා .. | එම .. | 1 | 0 | 0 | 16 |
| 9C | එම | .. රූකඩවැවේ කේ. එච්. වල්ලියා කොටහලුවා .. | එම .. | 1 | 0 | 6 | 16 |
| | | සිතියම 698. ගම—විලච්චියකෝරලේ දුනුදඹුවැව. | | | | | |
| 15A | මයිලගහලන්ද | .. දුනුදඹුවැවේ පී. ඒ. ආර්. ආරච්චි සහ වී. රංහාමි හිටපුආරච්චි .. | .. එම .. | 0 | 3 | 39 | 16 |
| | | සිතියම 636. ගම—කඩවත්කෝරලේ ඉසෙන්බැස්සවැව. | | | | | |
| 6I2 | ඉසෙන්බැස්සවැව කැලේ නොහොත් බොරලුවලහේන්යාය | ඉසෙන්බැස්සවැවේ යූ. කපුරාල .. | .. එම .. | 1 | 0 | 8 | 16 |
| | | සිතියම 670. ගම—විලච්චියකෝරලේ දිවුල්වැව. | | | | | |
| 20B | දිවුල්වැවලන්ද | .. ඇල්. අන්තෝනි .. | .. එම .. | 1 | 0 | 3 | 16 |
| 24B | එම | .. ගාලේවැවේ සී. වී. අප්පුහාමි .. | .. එම .. | 1 | 0 | 11 | 16 |
| | | සිතියම 687. ගම—විලච්චියකෝරලේ හම්මිල්ලෑව. | | | | | |
| 19A | පලුගහයායහේන | .. අමුනුකොලේ ඩබ්ලිව්. පුංචිරාල .. | එම .. | 2 | 0 | 18 | 17 |
| 21F | මීගහයායමූකලාන | .. එම .. | .. මූකලාන .. | 1 | 0 | 6 | 21 |
| 21H | එම | .. අමුනුකොලේ ඇස්. බී. සුද්දහාමි .. | එම .. | 3 | 0 | 21 | 21 |
| 21I | එම | .. අමුනුකොලේ ආර්. උක්කුබන්ඩා සහ වී. බංඩා | එම .. | 3 | 1 | 4 | 21 |
| 27C | කඳුරුගහයායේහේන | .. අමුනුකොලේ යූ. බංඩා සහ ඇම්. අප්පුරාල .. | හේන .. | 1 | 3 | 8 | 17 |
| 27D | එම | .. මැටිකෑවේ ඒ. ඇල්. මැනික්හාමි .. | එම .. | 1 | 0 | 16 | 17 |
| 47A | කටුපොතයායේහේන | .. මැටිකෑවේ ඇන්. කපුරාල වෙල්විදානේ .. | එම .. | 0 | 1 | 15 | 17 |
| 48 | කටුවිරගොල්ලෑව | .. එම .. | .. එම .. | 0 | 0 | 4·2 | 17 |
| 50C | වීරසෝලේයායේකැලේ | .. එම .. | .. එම .. | 1 | 2 | 20 | 17 |
| 47A1 | කටුපොතයායේහේන | .. එම .. | .. එම .. | 0 | 1 | 23 | 17 |
| 48C | අඩිපාර | .. එම .. | .. පාර .. | 0 | 0 | 4·5 | 17 |
| 50B | වීරසෝලේයායේකැලේ | .. එම .. | .. කැලේ .. | 1 | 3 | 2 | 17 |
| | | සිතියම 371. ගම—එප්පාවලකෝරලේ හුරිගස්වැව. | | | | | |
| 9D2 | ගඩලුයාය නොහොත් හුරිගස් වැවකැලේ | .. රජ්ජල්ලාගම ඩබ්ලිව්. ඇම්. හේතුහාමි ආරච්චිල | පරන හේන .. | 1 | 0 | 37 | 16 |
| | | සිතියම 493. ගම—නුවරගම්කෝරලේ පලුගස්වැව. | | | | | |
| 1F | පලුගස්වැවමූකලාන | .. රුවන්වැලිසෑයේ පන්සලේ පදිංචි සිඩාති උන්නාන්සේ .. | .. මූකලාන .. | 17 | 1 | 23 | 17 |

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ ගාල්ලේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 1වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වර්ගය.

---

මෙහි පහත නම් සඳහන්කරනුලබන රජසන්තක ඉඩම් කැබෙල්ල හේ සහ ගස් වැවීමට බද්ද පටන්ගන්න දිනේ පටන් ගණන් ගනිමින් එක එක තිස්අවුරුද්දකට වරක් බද්ද අමුතුකරන පංගාර්තුවට යටත්ව වර්ෂ 1920ක්වූ මැයි මස 28වෙනි දින පටන් අවුරුදු 99කට බදු ගැනීමට ඇරන ඉල්ලුම්පත්‍ර 1920ක්වූ මැයි මස 14වෙනි දිනට නොහොත් ඊට කල්මත්තෙන් ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් භාරගනු ලැබේ. ඉල්ළුම්කාරයා ඔහුගේ සම්පූර්ණ නම ගම සහ ලියුම් ලැබෙන ස්ථානය දැනුම්නුදුන්නොත්ද ඉඩම් කැබෙල්ලට සවහන්කර තිබෙන මිනින්දෝරු ගාස්තුව ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත බඳිනතුරුද එකී ඉල්ළුම්පත්‍රයක් භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද විකුණනතුරු නොහොත් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් ඉඩම නොවිකුණන්ට නියමකළොත් එසේ නියමකරනතුරු එකී බැඳපු මුදල ආපසු දෙනු නොලැබේ. වර්ෂ 1920ක්වූ මැයි මස 28වෙනි දිනදී බදුළු කච්චේරියේදී බදු විකිණීම රජසන්තක ඉඩම්වල බදු විකිණීම සම්බන්ධ ආණ්ඩුවේ රෙගුලාසිවල ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වැඩි ඉල්ලුම්කාරයා බද්ද ගැනුම්කාරයා වන්නේය.

බද්දේ කොන්දේසි ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන්ද ලබාගත හැකිය. ඒකේ සිතියම සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන් ලබාගත හැකිය.

ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ මහපලාත කෝරලේ පිහිටි ආණ්ඩුව සන්තක ඉඩම් කැබලි 1ක්.

අන්තිම සිතියමේ නොම්මරය. 26. ගම—උඩුකිඳ මහපලාතකෝරලේ ඇත්තලපිටියේගම.
ඉල්ලුම්කාරයා—ඩබ්ලිව්. ඩේවිඩ් මහතා.

| නො. | ඉඩමේ නම. | විස්තර | බිම්තරම, අ. රූ. ප. | අක්කරයකට මැනුම් ගාස්තුව රු. | වෙන්දේසිය පටන්ගත්ත අක්කරයක ප්‍රමියම් ගනණ. රු. ශ. | පලමු තිස් අවුරුද්දටඅක්කරයකට අවුරුද්දක බද්ද එක එක පලමු 6 අවුරුද්දට. රු. ශ. | එකළුක ඉතිරි 24අවුරුද්දට රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| 63BO | ගොඩවැවේපතන | කුඹුර | 10 0 34 | 3 | 3 0 | 1 0 | 3 0 |

මේ 1920ක්වූ අප්‍රෙල් මස 7වෙනි දින කොළඹ
මහලේකම්තුමාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තුමාරිස් වම්හ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

[හම්බන්තොට දැන්වීම නො. 7,519.]

මේ 1920ක්වූ අප්‍රෙල් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වූ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ෆ්‍රෙඩරික් එවිස් උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත්, එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත් සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ෆ්‍රෙඩරික් එවිස්,
විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ බස්නාහිර ගිරුවාපත්තුවේ ඕකෙක්වල යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—ලංකාමැනීමේ මුල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 24½ | පාර | 0 0 6 |

මීට මායිම්—උතුරට දෙකෙන්පංගුවේ තක්සේරුවට දීපු කොරතොටගේකොරටුවද (296,116ගේ පිඹුරුකඩදාසියේ පේන ඉඩම); නැගෙණහිරට වීරකෝන්බස්නායකගේ දෙන් චාර්ලිස් අප්පුහාමි විසින් අයිතිකම්කියන ගනිතගේවත්තද; දකුණට ඕකෙක්වෙල විහාරේ විසින් අයිතිකම්කියන ගනිතගේදෙනියද; බස්නාහිරට මහගනිතගේවතුයාය (ප්‍රවේනි).

II.—ලංකාමැනීමේ මුල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 59D | දෙවට (පාර) | 0 0 15 |

මීට මායිම්—උතුරට (ප්‍රවේනි) ගනිතගේවත්ත; නැගෙණහිරට පල්ලත්තර ගම්ඉමද; දකුණට වීරකෝන් බස්නායක චාර්ලිස් අප්පුහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන මලපලාවත්ත නොහොත් දම්තියගහවත්තද, 69,641 පිඹුරු කඩදාසියේ පේන ඉඩමද; බස්නාහිරට වීරකෝන් බස්නායක චාර්ලිස් අප්පුහාමි සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන දම්තියගහවත්තද, මුල්කිරිගල පන්සල විසින් අයිතිකම්කියන කරවලගහදෙනියද.

III.—ලංකාමැනීමේ මුල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 102½ | දෙවට (පාර) | 0 0 12 |

මීට මායිම්—උතුරට දෙකෙන්පංගුවේ තක්සේරුවට දුන් කෝන්ගහකොරටුවද, (296,640ගේ පිඹුරුකඩදාසියේ පේන ඉඩමද); 207,093නේ පිඹුරුකඩදාසියේ පේන ඉඩමද; නැගෙණහිරට කොටගේ විජේසිංහ බබුන් සහ තවත් අය විසින් අයිති කම්කියන කෝන්ගහකොරටුවද; දකුණට දෙකෙන්පංගුවේ තක්සේරුවට දීතිබෙන කෝන්ගහහේනද, (298,150ගේ පිඹුරු කඩදාසියේ පේන ඉඩමද; බස්නාහිරට කැදලකොටගේ ගම්මායිමද.

IV.—ලංකාමැනීමේ සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 108A | පාර | 0 0 8 |

මීට මායිම්—උතුරට විජේසිංගේ එලියස් විසින් අයිතිකම්කියන ඉහලදෙනියද, හේවාගමගේ සෙන්දිරිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන අලහේනද: නැගෙණහිරට විජේසින්ගේ එලියස් විසින් අයිතිකම්කියන ඉහලදෙනියද; දකුණට ජී. ඩබ්ලිව්. පින්අප්පු සහ තවත් අය විසින් අයිතිකම්කියන කැටකැලගහකොරටුවද, විජේසින්ගේ එලියස් විසින් අයිතිකම්කියන ඉහලදෙනියද; බස්නාහිරට විජේසින්ගේ එලියස් විසින් අයිතිකම්කියන ඉහලදෙනියද, (ප්‍රවේනි) වැව්කන්ඩියද.

V.—ලංකාමැනීමේ මුල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 123 | මහපාර | 2 3 30 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 491—495වෙනි පිටුවල ප්ලෑන් බලනු.

මීට මායිම්—උතුරට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක කරතිබෙන අම්බලමගාවාහේනද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක කරතිබෙන අම්බලමගාවා ඉඩමද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක කරපු බෝගහලහකඩේද, පාරක්ද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තකකරපු අම්බලමගාවාකඩේද, (ප්‍රවේනි) කහකන්දේකුඹුර සහ සියඹලාගහකුඹුරද, පාරක්ද, ආණ්ඩුව විසින් විකුණපු වැලිගමගේවත්තේහේනද, ආණ්ඩුව විසින් විකුණපු ජුල්ගහහේනද, (301,320 පිඹුරුකබඩසියේ ජේන ඉඩමද) දෙන් ජුවානිස් කුලතුංග අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන ලියන්ගහකොරටුවද, (323,150හේ පිඹුරුකබඩසියේ ජේන ඉඩමද), දෙන් කරෝලිස් කුලතුංග සහ තවත් අය විසින් අයිතිකම්කියන පතිරනගේකොරටුවද, ජී. දෙන් කරෝලිස් අප්පුහාමි විසින් අයිතිකම්කියන සක්කාරිගේවත්තද, පාරක්ද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ ප්‍රවේනිකර තිබෙන ගනේගන්වැවද (වැව) කන්කානන්ආච්චිගේ බබාගේ උරුමක්කාරයන් විසින් අයිතිකම්කියන බදුවත්තද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ ප්‍රවේනිකර තිබෙන ගනේගන්වැවද (වැව) නිදහස් ඔප්පුවක් පිට දීතිබෙන මලපලකැල්ලදෙනියද, (328,050 පිඹුරුකබඩසියේ ජේන ඉඩමද) ඞී. ඒ. කුලතුංග විසින් අයිතිකම්කියන කෝන්ගහකුඹුරද; නැගෙණ්ඉරට ඞී. ඒ. කුලතුංග විසින් අයිතිකම්කියන කෝන්ගහකුඹුරද, වන්නිආච්චිකන්කානන්ගේ බාලහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන හාල්පන්දෙනියේමහගේවත්තද, පල්ලත්තරගමේ මායිමද; දකුණට නිදහස් ඔප්පුවක් පිට දීතිබෙන බදුවත්තද, (296,641කේ පිඹුරුකබඩසියේ ජේන ඉඩමද) මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක කරතිබෙන බෝගහහේනද, (පාරට ඉතුරුකර තිබෙන බිම) ඞී. ඒ. කුලතුංග විසින් අයිතිකම්කියන කෝන්ගහකුඹුරද; බස්නාඉරට (ප්‍රවේනි) කහකන්දේකුඹුර සහ සියඹලාගහකුඹුරද, ගන්සභාපාරද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඹකරපු අම්බලමද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඹකරපු කොඩිතුවක්කුඹුරේඅත්මගද, මොදරවාගෙන් ගම්ඉමද.

### VI.—මුල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 124 | දෙවට (පාර) | 0 1 15 |

මීට මායිම්—උතුරට පද්දපිටිය සිට දම්මුල්ලට යන මහපාරද; නැගෙණ්ඉරට මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක කරතිබෙන බෝගහහේනද, (පාරට ඉතුරුකර තිබෙන බිම) ආණ්ඩුව විසින් විකුණ තිබෙන බෝගහහේනද (296,104 පිඹුරුකබඩසියේ ජේන ඉඩමද) ජයසේකරකන්කානන්ආච්චිගේ ඞිංගිරිඅප්පු විසින් අයිතිකම්කියන මයිලගහහේනද, හේවාගමගේ දවිත් විසින් අයිතිකම්කියන මයිලගහවත්ත නොහොත් මැදවත්ත, ජයසේකරකන්කානන්ආච්චිගේ අසෝහාමි විසින් අයිතිකම්කියන මයිලගහහේනද, පල්ලත්තර ගමේ ගම්ඉමද, ඈම්. දෙන් එලියස් සහ තවත් අය විසින් අයිතිකම්කියන ඉදිපිට්ටැහේන්දෙනියද; දකුණට පල්ලත්තර ගම්ඉමද; බස්නාඉරට හේවාගමගේ සෙන්දිරිස් සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන අලහේන්පිට්ටැන්නද, කන්කානන්ආච්චිගේ තෝමිස්හාමි විසින් අයිතිකම්කියන මහහේනද, කන්කානන්ආච්චිගේ සලමොන් විසින් අයිතිකම්කියන නුගේකොරටුවද, ආණ්ඩුව විසින් විකුණපු බෝගහහේනද, (296,104 පිඹුරුකබඩසියේ ජේන ඉඩමද) මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක කරතිබෙන බෝගහහේනද, (වැව්කන්ඩියට ඉතුරුකර තිබෙන බිම.)

### VII.—ලංකාමැනීමේ මූල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 125 | පාර | 0 1 20 |

මීට මායිම්—උතුරට (ප්‍රවේනි) පුහුගහවත්තද, ඩබ්ලිව්. බී. චාර්ලිස්අප්පු විසින් අයිතිකම්කියන මහවත්තද; නැගෙණ්ඉරට (ප්‍රවේනි) කෝරලේවලව්වවත්තද, ප්‍රවේනි ඉංගිනිගහවත්තද, ආණ්ඩුව විසින් විකුණපු ඉගිනිගහවත්තද, (296,950 පිඹුරුකබඩසියේ ජේන ඉඩමද), වීරකෝන් බස්නායක චාර්ලිස් අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන මේස්තිරිගේවත්ත සහ වැවගාවාවත්තද; දකුණට මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ ප්‍රවේනිකර තිබෙන ගනගන්වැව (වැව) දම්මුල්ලේ සිට පද්දපිටියට යන මහපාරද; බස්නාඉරට (ප්‍රවේනි) සක්කාරිගේවත්ත සහ කෝට්ටගේවත්ත, ආණ්ඩුව විසින් විකුණපු කපුකොරටුව (296,949 පිඹුරුකබඩසියේ ජේන ඉඩමද, (ප්‍රවේනි) පුහුගහවත්තද.

### VIII.—ලංකාමැනීමේ මූල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 126 | පාර | 0 1 12 |

මීට මායිම්—උතුරට (ප්‍රවේනි) කහකන්දකුඹුර සහ සියඹලාගහකුඹුරද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක කරතිබෙන වැව්කන්ඩියද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක කරතිබෙන බූවැවද (වැව) මහරදගේ සෙරීයා සහ තවත් අය විසින් අයිතිකම්කියන මලිගොඩගේදෙනියද, ආණ්ඩුව විසින් විකුණපු කන්කානන්ගේකොරටුව (299,152කේ පිඹුරුකබඩසියේ ජේන ඉඩමද); නැගෙණ්ඉරට ආණ්ඩුව විසින් විකුණපු කන්කානන්ගේකොරටුවද (299,152කේ පිඹුරුකබඩසියේ ජේන ඉඩමද; දකුණට ආණ්ඩුව විසින් විකුණපු ලියන්ගහකොරටුව නොහොත් තල්ගස්කොරටුවද, (310,166යේ පිඹුරුකබඩසියේ ජේන ඉඩමද. දෙකොන්පංගුවේ තක්සේරුවේ මුදලට දුන් එගොඩවත්තද, (323,158වේ පිඹුරුකබඩසියේ ජේන ඉඩමද, (323,158වේ පිඹුරුකබඩසියේ ජේන ඉඩමද, ආණ්ඩුව විසින් විකුණපු කිතුලකොරටුව නොහොත් පල්ලත්තර බුරුලගේවත්ත නොහොත් මාලින්බඩගේවත්තද, (301,320 පිඹුරුකබඩසියේ ජේන ඉඩමද), ආණ්ඩුව විසින් විකුණපු වැලිගමගේවතතහේන (301,320 පිඹුරුකබඩසියේ ජේන ඉඩමද); බස්නාඉරට දම්මුල්ලේ සිට පද්දපිටියට යන මහපාරද.

### IX.—ලංකාමැනීමේ මූල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමෙ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 128 | ගම්සභාපාර | 0 0 26 |

මීට මායිම්—උතුරට පද්දපිටිය සිට දම්මුල්ලට යන මහපාරද; නැගෙණ්ඉරට (ප්‍රවේනි) කහකන්දකුඹුර සහ සියඹලාගහකුඹුරද; දකුණට කෑදලකොටඹේ ගම්ඉමද; බස්නාඉරට (ප්‍රවේනි) කහකන්දකුඹුර සහ සියඹලාගහකුඹුරද, මුඩුබිම් සම්බන්ධ රෙකුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඹකරපු අම්බලමද.

### X.—ලංකාමැනීමේ මූල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 129 | කිරමආර (පංගුව) | 1 3 10 |

මීට මායිම්—උතුරට (ප්‍රවේනි) කහකන්දකුඹුර සහ සියඹලාගහකුඹුරද, වීරකෝන් බස්නායක චාර්ලිස් අප්පුහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන වැල්කුඹුරේඅත්මගද. (ප්‍රවේනි) කහන්දකුඹුර සහ සියඹලාගහකුඹුරද; නැගෙණ්ඉරට (ප්‍රවේනි) කහකන්දකුඹුර සහ සියඹලාගහකුඹුරද, (ප්‍රවේනි) මීගහවතුයායද; දකුණට කෑදලකොටඹේ ගම්ඉමද, (කිරමආර); බස්නාඉරට කෑදලකොටඹේ ගම්ඉමද, (කිරමආරද) හීනටිහතමුනේ ගම්ඉමද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටිය මේ දැන්වීමෙන් මේ කොටසෙන් අත්හැරියවගත් ඒකේ මුළු බිම්තරම වන රූඞ් 2කුත් පර්චස් 28 ඉහතකී අක්කර 1කුත් රූඞ් 3කුත් පර්චස් 10යේ බිම්තරමේ අඩංගු නොවෙන වගත් මෙයින් දැනගත යුතුයි.

ලංකාමැනීමේ මූල් සිතියම 271.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
| --- | --- | --- |
| 62 | වැලිකුඹුරේඅත්මග | 0 2 28 |

[හම්බන්තොට වි. ම. 6—1920.]

[ජපනේ දූත්වීම නො. 7,520.]

**වර්ෂ 1897නේ, 1899යේ, 1900යේ සහ 1903නේ මුඩු ඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.**

මෙහි පහත සඳහන්වෙන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩි ගණනකට යම් අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත ජාපනේ කච්චේරියට ඇවිත් උතුරු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒවට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී ඒජන්ත උන්නාන්සේ විසින් එකී ආඥාපණත්වලින් උන්නාන්සේට ලැබී තිබෙන බලපූර්වන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම් රජසන්තක ඉඩම් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන්,
උතුරු දිසාවේ ඒජන්ත උන්නාන්සේ.

ඉඩම්වල තොරතුරු.

මීට යාකරනලද සිතියමේ* ජේන උතුරු දිසාවේ ජාපන දිස්ත්‍රික්කේ වලිකාමම් නැගෙණහිර පලාතේ අච්චුවේලියේ තම්පාල යන ගම පිහිටි මෙහි පහත සඳහන්වූ බිම්කට්ටිය :—

I.—මුල් සිතියම 5,090.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 .. | පිඩ්ඩිමාන්ඩාන් මල්ලඩියකාඩු .. .. .. .. | 2 1 22 |

මෙහි පහත සඳහම්වූ මායිම්—උතුරට (P. P. 5,090|3 දරන ආණ්ඩුවේ තහනම්) පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුද; නැගෙණහිරට 5,090/2 දරන ආණ්ඩුවේ තහනම් පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුද; දකුණට ආණ්ඩුවේ අයිතිකම්කියා සිටින තරමෙව සහ බස්නාහිරට වලලායි යන ගමයේ මායිම්ය.

II.—මුල් සිතියම 5,090.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 2 .. | පිඩ්ඩිමාන්ඩාන්මල්ලාඩියකාඩු (පාරට තහනම්) .. .. .. | 0 0 39 |

මෙහි පහත සඳහන්වූ මායිම්—උතුරට (P. P. 5,090|3 දරන ආණ්ඩුවේ තහනම්) පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුද; නැගෙණහිරට (P. P. 5,090/4) ආණ්ඩුවේ අයිතිවාසිකම්කියා සිටින පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුද; දකුණට ගමපාරද සහ බස්නාහිරට (P. P. 5,090/1) ආණ්ඩුවේ අයිතිවාසිකම්කියා සිටින පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුත්ය.

III.—මුල් සිතියම 5,090.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 3 .. | පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩු (පාරවලට තහනම්) .. .. | 1 2 27 |

මෙහි පහත සඳහම්වූ මායිම්—උතුරට කාංකේසන්තුර සිට පරිතිතුරට යන පාරද; නැගෙණහිරට අච්චුවේලි සිට පරිතිතුරට යන පාරද; දකුණට ආණ්ඩුව අයිතිවාසිකම් කියා සිටින තරමෙවද සහ (P. P. 5,090/4 සහ 5) ආණ්ඩුවේ අයිතිවාසිකම් කියා සිටින පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුද සහ (P. P. 5,090/2) දරන ආණ්ඩුවේ තහනම්) පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුද සහ (P. P. 5,090/1) ආණ්ඩුව අයිතිවාසිකම් කියා සිටින සිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුද සහ බස්නාහිරට වලලායි යන ගමයේ මායිම්ය.

IV.—මුල් සිතියම 5,090.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 5 .. | පිඩ්ඩිමාන්ඩාන්මල්ලාඩියකාඩු .. .. .. .. | 7 3 3 |

මෙහි පහත සඳහම්වූ මායිම්—උතුරට සහ නැගෙණහිරට P. P. 5,090/3 දරන ආණ්ඩුවේ තහනම්) පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුද; දකුණට ආණ්ඩුව අයිතිවාසිකම් කියා සිටින තරමෙවද, සහ (P. P. 5,090/4) ආණ්ඩුවේ අයිතිවාසිකම් කියා සිටින පිඩ්ඩිමාන්ඩාන් මල්ලාඩියකාඩුත්ය.

* ඉංග්‍රිසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 495—497වෙනි පිටුවල ප්ලෑන් බලනු.

---

[කුරුණෑගල දූත්වීම නො. 7,521.]

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට අයිතිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෙෂ මන්ත්‍රිශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කේ දඹදෙනිහත්පත්තුවේ දකුනු උඩුකහකෝරළේ පහලබුජ්ජමුව යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන 474 ලංකාමැනීමේ මුල් සිතියමේ $49\frac{1}{2}$න් ජේන රූඩ් 1කුත් පර්චස් 21ක් බිම්තරම ඇති සාමාන්‍යවශයෙන් ගන්සභාපාර කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම් :—උතුරට කොළඹ සිට මහනුවරට යන රේල්පාරද; නැගෙණහිරට අස්සන් අලියාර් අබ්දුල් රහිමන් සහ තවත් අය විසින් අයිතිකම්කියන හුරිගහ මූලවත්ත නොහොත් බෝගහමූලවත්තද, අස්සන් අලියාර් අබ්දුල් රහිමන් විසින් අයිතිකම්කියන ඔව්ටවත්තද, රනතුංග ජය සේකර ආරච්චිල්ලාගේ සලෝහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන කදුරුගහමූලවත්තද, සෙලෝහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන එපිටවෙලකුඹුරද, ආණ්ඩුව විසින් විකුනාපු කැටකැලගහමූලහේනද, (314,503 පිඹුරුකඩදාසියේ ජේන ඉඩම) සෙලෝහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන එපිටවෙලකුඹුරද, ආණ්ඩුව විසින් විකුනාපු කන්කුන්දන්ගහමූලහේනද, 326,211 පිඹුරුකඩදාසියේ ජේන ඉඩම) ආණ්ඩුව විසින් විකුනාපු පොල්වත්තේහේනද, 314,734 පිඹුරුකඩදාසියේ ජේන ඉඩම); දකුණට දියපාරක්ද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුනාපු පොල්වත්තේහේනද, (314,734 පිඹුරුකඩදාසියේ ජේන ඉඩම) ආණ්ඩුව විසින් විකුනාපු කන්කුන් දන්ගහමූලහේනද, (326,211 පිඹුරුකඩදාසියේ ජේන ඉඩම) සෙලෝහාමි සහ තවත් අය විසින් අයිතිකම්කියන එපිටවෙලකුඹුරද, රනමුකආච්චිලාගේ බන්ඩියා සහ තවත් අය විසින් අයිතිකම්කියන පහලවත්තුයායද, අස්සන් අලියාර් අබ්දුල්රහිමන් විසින් අයිතිකම්කියන ඔව්ටවත්තද, එම අය විසින් අයිතිකම්කියන කනත්තේකොටුවේ කුඹුරද.

* ඉංග්‍රිසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 498වෙනි පිටේ ප්ලෑනය බලනු.

[කුරුණෑගල වි. ම. 20—1920.]

[කුරුණෑගල දැන්වීම නො. 7,522.]

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී, මෙහි පහත දක්වන ඉඩමට හෝ එයින් කොටසකට හෝ යම් අයිතිකමක් තිබෙනවාය කියන යම් අයෙක් ඇත්නම් ඒ අය විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900යේ සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇම්. ට්. ආර්චිබෝල්ඩ් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩමට හෝ එහි කොටසකට කිසි අයිතිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම රජසන්තක ඉඩමක්ය කියා උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇම්. ට්. ආර්චිබෝල්ඩ්,
විශේෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩමට උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩමේ තොරතුරු.

වයඹ දිසාවේ කුරුනෑගල දිස්ත්‍රික්කේ හිරියාල හත්පත්තුවේ ඉහල විසිදෙකේ කෝරලේ උඩත්තපොල යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියමේ* පෙනියන 4,291 මුල්සිතියමේ S 70වෙන් පෙනෙන පර්චස් 6ක් බිම්තරම ඇති සාමාන්‍ය වස යෙන් පාරට ඉතුරුකර තිබෙන බිම්කට්ටිය කියන නොහොත් ඒ නමින් දැනගෙන තිබෙන බිම්කට්ටියට මායිම්—උතුරට දෙඩන්ගස්ලන්දහිට මදුරගොඩට යන පාරද; නැගෙනහිරට ඉතුරුකරතිබෙන බිම්කට්ටියක්ද; දකුනට ආණ්ඩුව විසින් විකුනාපු වෙවැල්හේනද, මුඩුබිම් සම්බන්ධ රෙගුලාසිය යටතේ රජසන්තක හැටියට ප්‍රසිඩකරපු අඩිපාරක්ද; බස්නාහිරට බන්ඩියා විසින් අයිතිකම්කියන පිහිලඇලහේනද.

* ඉංග්‍රිසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 499වෙනි පිටේ ප්ලෑනය බලනු

[කුරුණෑගල වි. ම. 21—1920.]

---

[අනුරාධපුර දැන්වීම නො. 7,523.]

වර්ෂ 1920ක්වූ අප්‍රේල් මස 9වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්ෂ 1897, 1899, 1900 සහ 1903නේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරණලැබූ විශෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඇන්. ඒ. හැම්ප්ටන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙණීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඒට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී විශෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සෑම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේගේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඇන්. ඒ. හැම්ප්ටන්,
විශෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

මෙකී ඉඩම්වල නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වවල අයිතිකම්කීම හැටියට බාරගනු ලැබේ.

ඉඩම්වල තොරතුරු.

උතුරු මධ්‍යම දිසාවේ නුවරගම් පලාතේ කනදරකෝරලේ ඇල්වේතුලානේ කොක්මඩුව යන ගම පිහිටා තිබෙන මිට අමුනාපු සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

ලංකාමැනීමේ මුල් සිතියම 754.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම. අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | නුගගහයාය, බෝගහයාය, දඹගහලන්ද, කටුකැලියාවේ වැවලන්ද (ආණ්ඩුව විසින් වැසියන්ගේ ප්‍රයෝජනයට ඉතුරුකර තිබෙන රජසන්තක හේන .. .. | 172 | 2 | 1 |
| 4 | වෙල්ල (කුඹුරේ ඇල) .. .. | 0 | 0 | 14 |
| 6 | එම .. .. | 0 | 0 | 26 |
| 8 | වැකන්ද පාවුලකැල්ල (වැව්කන්ඩියට ඉතුරුකර තිබෙන බිම) .. .. | 2 | 2 | 8 |
| 9 | කටුකැලියාවේවැව (වැව සහ වැව්කන්ඩිය) | 42 | 1 | 32 |
| 11 | වෙල්ල (කුඹුරේ ඇල) .. .. | 0 | 0 | 19 |
| 13 | වැකන්ද පාවුල කැල්ල (වැව් කන්ඩියට ඉතුරුකර තිබෙන බිම) .. .. | 1 | 1 | 3 |
| 14 | විහාරේ වැව (වැව සහ වැව්කන්ඩිය) .. | 7 | 3 | 21 |
| 15 | විහාරේ පාවුල ලන්ද .. .. | 2 | 1 | 21 |
| 16 | අඩිපාරට ඉතුරුකර තිබෙන බිම .. | 0 | 0 | 29 |
| 16½ | අඩිපාර .. .. | 0 | 0 | 4 |
| 18 | විහාරේ පාවුලලන්ද, හෙරුවැල්ලන්ද, පන්සල්පාරේලන්ද, පාළුවත්තේලන්ද, (ආණ්ඩුව විසින් වැසියන්ගේ ප්‍රයෝජනයට ඉතුරුකර තිබෙන රජසන්තක හේන) .. | 35 | 1 | 1 |
| 19 | කොක්මඩුවේවැව (වැව සහ වැව්කන්ඩිය) .. | 249 | 2 | 8 |
| 20 | අඩිපාරට ඉතුරුකර තිබෙන බිම .. | 0 | 1 | 12 |
| 21 | පන්සලේවාහේලන්ද, කටුකැලියාවේහේන, වැකන්ද පාවුල කටුපත්කැලේ (ආණ්ඩුව විසින් වැසියන්ගේ ප්‍රයෝජනයට ඉතුරුකර තිබෙන රජසන්තක හේන) .. | 86 | 3 | 7 |
| 22 | අඩිපාරට ඉතුරුකර තිබෙන බිම .. | 0 | 1 | 34 |
| 22½ | අඩිපාර .. .. | 0 | 0 | 9 |
| 23 | කටුකැලියාවේ ලන්ද (ආණ්ඩුව විසින් වැසියන්ට ඉතුරුකර තිබෙන රජසන්තක හේන) .. .. | 7 | 1 | 7 |
| 24 | වෙල්ල (ඇල) .. .. | 0 | 0 | 8 |
| 25 | වෙල්ල (කුඹුරේ ඇල) .. .. | 0 | 0 | 16 |
| 28 | අක්කර ඉස්මත්තේ ලන්ද, දෙහිගහලන්ද, කටුකැලියාවේලන්ද .. .. | 27 | 0 | 33 |
| 30 | හොරෙව් ඇල (කුඹුරේ ඇල) .. | 0 | 2 | 16 |
| 31 | කටුකැලියාවේමුකලාන.. .. | 3 | 2 | 14 |
| 34 | පන්සල්වාහේලන්ද (වැව්කන්ඩියට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 2 | 0 |
| 35 | වාන්ඇල .. .. | 0 | 0 | 32 |
| 36 | වැකන්දපාවුලකැල්ල (වැව්කන්ඩියට ඉතුරුකර තිබෙන බිම) .. .. | 4 | 0 | 31 |
| 40 | හොරෙව්ඇල .. .. | 0 | 2 | 22 |
| 42 | වැකන්දපාවුලකැල්ල (වැවට දැහට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 3 | 30 |
| 44 | තිස්බඹ (සනීපආරක්ෂාවට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 0 | 39 |
| 45 | (මුඩුබිම) .. .. | 0 | 0 | 25 |
| 47 | වැවඉස්මත්තේහේන්ඝාය .. | 50 | 0 | 9 |
| 48 | කරත්තපාර .. .. | 0 | 1 | 0 |
| 49 | පාර (මිනිපිට්ටනියට යන පාර) .. | 0 | 0 | 9 |
| 50 | මිනිපිටිය (මිනිපිට්ටනිය).. .. | 0 | 1 | 38 |
| 51 | බෝගහලන්ද .. .. | 10 | 2 | 8 |
| 52 | අඩිපාර .. .. | 0 | 0 | 8 |
| 53 | තිස්බඹ (සනීපආරක්ෂාවට ඉතුරුකර තිබෙන බිම) .. .. | 4 | 2 | 12 |
| 55 | පාර .. .. .. | 0 | 0 | 27 |
| 56 | තිස්බඹ (සනීපආරක්ෂාවට ඉතුරුකර තිබෙන බිම) .. .. | 0 | 1 | 10 |
| 59 | පුල්ලයාර්කෝවිලේලන්ද .. | 24 | 2 | 22 |
| 61 | තිබොල්ගලේලන්ද .. .. | 1 | 2 | 15 |
| 63 | ගල්මුල්ල (ගල) .. .. | 0 | 3 | 15 |
| 73 | වෙල්ල (කුඹුරේඇල (ඇලේ මහතින් හරි පංගුවක්) .. .. | 0 | 0 | 7 |
| | | 741 | 1 | 22 |

* ඉංග්‍රිසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 500වෙනි පිටේ ප්ලෑනය බලනු.

මීට මායිම්—උතුරට කහටගොල්ලෑවේ ගම්ඉමද, අන්දරගොල්ලෑවේ ගම්ඉමද, උඩ්ඩියන්කුලම් කෝරලේ මායිමද; නැගෙනහිරට උඩ්ඩියන්කුලම් කෝරලේ මායිමද; දකුණට උඩ්ඩියන්කුලම්කෝරලේ මායිමද, බැක්කෑවේ ගම්මායිමද; බස්නාහිරට බැක්කෑවේ ගම්ඉමද, කහටගොල්ලෑවේ ගම්ඉමද.

ඉහතකී මායිම්වලට මැදිවූ මෙහි පහත දක්වන බිම්කට්ටි මේ දැන්වීමේ ෙ අත්හැරිය වගත් ඒවායේ මුළු බිම්තරම වන අක්කර 258කුත් පර්චස් 30හ ඉහතකී අක්කර 741කුත් රූඩ් 1කුත් පර්චස් 22කේ බිම්තරමේ අඩංගු නොවෙන වගත් මෙයින් දැනගත යුතුයි.

ලංකාමැනීමේ මුල් සිතියම 754.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 2 | දඹගහලන්ද .. .. | 0 | 3 | 36 |
| 3 | දඹගහඅක්කරේ, මීගහඅක්කරේ, කටුකැලියාවේඅක්කරේ, ඉදිගහහේනේඅක්කරේ, ගල්ගොඩඅක්කරේ (209,255, 236,452, 236,453, 263,942, 288,413, 288,518, 295,329, 295,330, 295,331, 299,152, පිඹුරුකඩදාසිවල පෙනෙන ඉඩම්) .. | 42 | 3 | 29 |
| 5 | කටුකැලියාවේපුරණවෙල .. | 10 | 0 | 25 |
| 7 | කටුකැලියාවේකුඹුර .. .. | 0 | 2 | 28 |
| 10 | විහාරේවෙල .. .. | 8 | 1 | 26 |
| 12 | පන්සලවත්ත .. .. | 1 | 0 | 6 |
| 17 | පන්සල්වත්ත .. .. | 5 | 2 | 3 |
| 26 | දෙහිගහලන්ද අක්කරේ (263,311, 288,103, 292,683, 292,686යේත් පිඹුරුකඩදාසිවල පේන ඉඩම්) .. .. | 8 | 2 | 31 |
| 27 | කරදගහකුඹුර .. .. | 2 | 3 | 32 |
| 29 | පළුගහඅක්කරේ (330,718 පිඹුරුකඩදාසියේ පේන ඉඩම) .. .. | 2 | 2 | 31 |
| 32 | ඉහලබාගේඉස්මත්ත අක්කරේ (265,900, 265,901 පිඹුරුකඩදාසිවල පේන ඉඩම්) .. | 2 | 2 | 9 |
| 33 | පොල්වත්තේඅක්කරේ .. .. | 8 | 2 | 28 |
| 37 | පුරණවෙල .. .. | 0 | 2 | 30 |
| 38 | එම .. .. | 80 | 0 | 4 |
| 39 | හොරෙවිවලගහඅක්කරේ (176,622 පිඹුරුකඩදාසියේ පේන ඉඩම) .. .. | 0 | 1 | 24 |
| 41 | ගන්මැද්ද .. .. | 5 | 0 | 34 |
| 43 | වත්ත .. .. | 0 | 1 | 2 |
| 46 | පළුගහ අක්කරේ, ඇහැටුගහ අක්කරේ (251,964, 265,912, 280,369, 280,370 පිඹුරුකඩදාසිවල පේන ඉඩම්) .. | 5 | 0 | 23 |
| 54 | ගන්මැද්ද .. .. | 1 | 2 | 24 |
| 57 | එම .. .. | 1 | 0 | 18 |
| 58 | එම .. .. | 1 | 1 | 17 |
| 60 | කිබොල්ගෙල්ලන්ද (265,904 පිඹුරුකඩදාසියේ පේන ඉඩම) .. .. | 3 | 3 | 30 |
| 62 | ගනන්කැටකුඹුර .. .. | 2 | 0 | 37 |
| 64 | මීගහඅක්කරේ, ගනින්කැටඅක්කරේ (224,481, 230,896; 182,571, 186,869, 230,897, 277,653, 277,097, 265,964රේත් පිඹුරුකඩදාසිවල පේන ඉඩම්) .. | 11 | 3 | 26 |
| 65 | පුරණවෙල .. .. | 15 | 3 | 5 |
| 66 | එම .. .. | 0 | 3 | 39 |
| 67 | මසිලගහඅක්කරේ (230,898වේ පිඹුරුකඩදාසියේ පේන ඉඩම) .. .. | 0 | 0 | 4 |
| 68 | මීගගඅක්කරේ (149,098වේ පිඹුරුකඩදාසියේ පේන ඉඩම) .. .. | 6 | 1 | 34 |
| 69 | මසිලගහකුඹුර .. .. | 0 | 2 | 6 |
| 70 | හෙලඹගහ අක්කරේ (149,097, 172,400, 194,161, 202,382, 230,889, 317,046) .. | 23 | 1 | 17 |
| 71 | හෙලඹගහකුඹුර .. .. | 1 | 1 | 29 |
| 72 | එම .. .. | 0 | 1 | 23 |
| | | 258 | 0 | 30 |

[අනුරාධපුර වි. ම. 10—1920.]

---

**රා සහ අරක්කු නැබෑරුම් සම්බන්ධ වෂී 1912යේ අඩකා 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.**

වෂී 1920 සහ 1921 ගණනේ මාතලේ රා රේන්දය.

1. වෂී 1920ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින සිට වෂී 1921ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දිනට ගතවන දොළොස් මාසයතුළ මෙහි පහත දක්වන ෂැඹුල්පත්‍ර ස්ථානවල රා බෙදා විකිනීමට බලය වෂී 1920ක්වූ අප්‍රෙල් මස 20වෙනි දින දවල් 10ට මාතලේ කච්චේරියේදී ප්‍රසිඛ වෙන්දේසියෙන් විකුණනබව මෙයින් දැනුම් දෙමි.

2. විකිනීම සම්බන්ධ කොන්දේසි ඒ ඒ පලාත්වල රටේ මහත්වරුන්ගෙන් හෝ මාතලේ උප ඒජන්ත තුමාගෙන් ලබාගතහැකිය.

වෂී 1920ක්වූ අප්‍රෙල් මස
1වෙනි දින දීය.

ඊ. වී. මිලින්ටන්,
උප ඒජන්ත උන්නාන්සේ.

ෂැඹුල් පත්‍රය.

මාතලේ දිස්ත්‍රික්කය.

| නො. | පලාත. | ස්ථාන නොහොත් ස්ථානය අඩංගු ප්‍රමාන. |
|---|---|---|
| 1 | මාතලේ උතුරු පලාත .. | අම්බොක්ක සහ මිල්ලවාන වසමතුල |
| 2 | එම .. | අකුරම්බොඩ වසමතුල |
| 3 | දකුණුපලාත .. | උඩස්ගිරිය වසමතුල |
| 4 | එම .. | ගම්මුල්ල වසමතුල |
| 5 | එම .. | දූල්ලෑව වසමතුල |
| 6 | එම .. | ගල්වඩුකුඹුර වසමතුල |
| 7 | එම .. | උඩුගම වසමතුල |
| 8 | එම .. | අළුවිහාරය වසමතුල |
| 9 | එම .. | මාතලේ ලෝකල්බෝඩ් සීමාතුල |
| 10 | එම .. | හුලන්ගමුවේ වසම සහ ලෝකල්බෝඩ් සීමාවලින්පිට |
| 11 | එම .. | පූර්ජ්ජල වසමතුල |
| 12 | එම .. | නැන්න වසමතුල |
| 13 | එම .. | වාරියපොල වසමතුල |
| 14 | එම .. | උකුවල වසමතුල |
| 15 | දකුණුපලාත .. | කඩුවෙල වසමතුල |
| 16 | එම .. | මූවන්දෙනිය වසමතුල |
| 17 | එම .. | බන්ඩාරපොල, උල්පතපිටිය වසමතුල |
| 18 | එම .. | පල්ලෙහපුවිද වසමතුල |
| 19 | එම .. | ඇල්කඩුවේ ගමේ මායිම්තුල උකුවල ඇල්කඩුපාරේ තිබෙන ඇල්කඩුවේ කඩමන්ඩියේ හන්දියේ සිට යන පාරේ හැතැප්ම 1ක් කනුවට සහ ½කනුවටත් අතර සුදුසුයයි කියා තෝරාගන්ට යෙදෙන ස්ථානය |
| 20 | නැගෙණහිර පලාත .. | රත්තොට සැන්ටරි බෝඩ් ටවුමේ සීමාතුල |
| 21 | එම .. | මාඋස්සාගොල්ලේ වසමතුල |
| 22 | එම .. | පල්ලේගම වසමතුල |
| 23 | එම .. | වේරගම වසමතුල |
| 24 | එම .. | ඇටන්වල වසමතුල |

---

H. R. COTTLE, ACTING GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.